# 8 කොටස

## ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථානය අධීක්ෂණය කිරීම

දිස්ත්‍රික්කය :...............................................................................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසය :...........................................................................................

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී කොට්ඨාසය:..................................................................................

බර කිරන මධ්‍යස්ථානය :...............................................................................................

අධීක්ෂණය කළ දිනය :...........................................................................................

අධීක්ෂණ නිලධාරියාගේ නම සහ තනතුර: ..................................................................................

**අවසන් ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථානයේ අධීක්ෂණයේ තොරතුරු**

පෙර අධීක්ෂණ දිනය :-.........................................................................................

අධීක්ෂණ නිලධාරියාගේ තනතුර :-...........................................................................................

ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කර :- ඇත/ නැත

ක්‍රියාත්මක නොවූ නිර්දේශ පිළිබඳ විස්තර :-...........................................................................

..............................................................................................................................................

## 1. තත්ත්ව තක්සේරුව

| අනු අංකය | ශක්තිමත් කළ යුතු කරුණු | අදහස් | | |
|---|---|---|---|---|
| 1 | **බර කිරීමේ මධ්‍යස්ථානය සංවිධානය කර ගැනීම** | | | |
| 1.1 | ප්‍රදේශයේ ජනතාවට බර කිරන මධ්‍යස්ථානයට පැමිණීමට ඇති පහසුව<br>සැම දෙනාටම ළඟා වීමට පහසු පරිදි ප්‍රදේශයේ කේන්ද්‍රීය ස්ථානයක් වීම හෝ සියලු දෙනාටම භාවිතා කළ හැකි ප්‍රවාහන පහසුකම් සහිත ස්ථානයක් වීම) | | | |
| 1.2 | ආරක්ෂිත ස්ථානයක් වීම<br>ළමයින්ට සහ රැකබලාගන්නන්ට හදිසි අනතුරුවලින් තොර ආරක්ෂිත ස්ථානයක් වීම | | | |
| | | | අපේක්ෂිත ගණන | පැමිණි ගණන |
| 1.3 | බර කිරීමේ මධ්‍යස්ථානයට පැමිණෙන ළමුන් සංඛ්‍යාව (ප්‍රදේශයට අදාළ ජනගහනයට අයත් ළදරු වර්ධක සටහනෙහි B කොටස්වලින් මෙම තොරතුරු කල්තියා රැස් කර තබා ගත යුතුය) | ළදරුවන් | | |
| | | අවු 1-2 | | |
| | | අවු 2-5 | | |
| | | එකතුව | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1.4 | බර කිරීමට නියමිත ළමුන් පමණක් පැමිණෙන බව<br>– අවු 2 ට අඩු සියලුම ළමුන් සහ වර්ධන ගැටලු සහිත අවු 2 ට වැඩි ළමුන් මසකට වරක්<br>– සාමාන්‍ය වර්ධනයක් සහිත අවු 2 ට වැඩි ළමුන් මාස 3 කට වරක්<br><br>(අධීක්ෂණ දිනයට අදාළ බර කිරීමේ මධ්‍යස්ථානයට පැමිණෙන දරුවන්ගේ CHDR 10 හෝ 15 තෝරාගන්න) | | | | | |
| 1.5 | ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් වීම<br>– ඕනෑම අවස්ථාවක බර කිරීමට නියමිත කණ්ඩායමට පැමිණ සිටීමට ප්‍රමාණවත් ඉඩකඩක් පැවතිම | | | | | |
| **2** | **බර කිරීමේ ක්‍රමවේදය** | | | | | |
| 2.1 | බර කිරීමේ සැසිය ආරම්භ කිරීමට පෙර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය තරාදිය නිසි පරිදි ක්‍රියා කරන්නේදැයි පරික්ෂා කරයි | | | | | |
| 2.2 | තරාදිය ආරක්ෂිතව එල්ලා ගනියි | | | | | |
| 2.3 | තරාදියේ මුහුණත පරීක්ෂකගේ ඇස් මට්ටමේ සිටින ලෙස එල්ලා ගනියි | | | | | |
| 2.4 | බර කිරීමට අන්දවන කලිසම හොඳ තත්ත්වයේ ඇත | | | | | |
| | | **1**<br>දරුවා | **2**<br>දරුවා | **3**<br>දරුවා | **4**<br>දරුවා | **5**<br>දරුවා |
| 2.5 | බර කිරන ක්‍රමය මවට/ භාරකරුට පැහැදිලිව විස්තර කරයි. ඔවුහු නිවැරදිව සහය වීමට දැන සිටිති | | | | | |
| 2.6 | දරුවාට බර කිරීමට අන්දවන කලිසම තරාදියේ එල්ලා දර්ශකය (මිනුම් කටුව ) බිංදුවට සිටින තෙක් තුලනය කර ගනියි | | | | | |
| 2.7 | මව / භාරකරු දරුවාගේ ඇඳුම් ඉවත් කරයි | | | | | |
| 2.8 | ළදරුවන් ඇඳුම් සම්පූර්ණයෙන්ම ඉවත් කර බර කිරීම කරයි<br>(නමුත් ශීත පරිසරයකදී නම් දරුවා බ්ලැන්කට්ටුවකින් ඔතා බර කිරා ගත හැකි නමුත් ආරම්භයේදී බර කිරන කලිසම තුලනය කර පරිදි බ්ලැන්කට්ටුවද සමඟ තරාදිය තුලනය කර ගත යුතුය) | | | | | |
| 2.9 | අවුරුදු 1 ට වැඩි දරුවන් සැහැල්ලු යට ඇඳුමක් පමණක් තිබියදී හෝ අවම බර ඇති ඇඳුම් සහිතව බර කිරා ගැනීම සිදු කරයි | | | | | |
| 2.10 | මවගේ/ භාරකරුගේ සහාය ඇතිව දරුවාට බර කිරන කලිසම අන්දවා දරුවා තරාදියේ එල්ලයි | | | | | |
| 2.11 | තරාදියේ එල්ලූ විට දරුවාගේ පාද පොළොවේ නොගෑවෙන බවට වගබලා ගනී | | | | | |
| 2.12 | දර්ශකය (මිනුම් කටුව) නොසෙල්වෙන අවස්ථාවට පැමිණි විගසම බර නිවැරදිව කියවා ගනී | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **3** | **පාඨාංකය සටහන් කර ගැනීම සහ අර්ථ දැක්වීම** | | | | | |
| 3.1 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින්ම දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනේ B කොටසේ ප්‍රස්ථාරයේ එම පාඨාංකය නිවැරදිව සටහන් කරයි | | | | | |
| 3.2 | ඉන්පසු දරුවාගේ සෞඛ්‍ය සහ සංවර්ධන සටහනේ A කොටසේ වයසට සරිලන බර ප්‍රස්ථාරයේ එම පාඨාංකය නිවැරදිව සටහන් කරයි | | | | | |
| 3.3 | මිනුම් අගයන් අර්ථ දැක්වීම<br>– කලාපයට අදාළව (පාඨාංකය සලකුණු කළ කලාපයට අදාළ කේතය ) | | | | | |
| | – වර්ධන රේඛාවේ දිශාව (වර්ධනයේ අඩාලවීමක් තිබේද යන්න/ රේඛාව ඉහළට දිශානතවීමෙන් අධිබරට අවදානම ඇති බව) | | | | | |
| | – සෞඛ්‍ය වර්ධන සටහනේ B කොටසේ කේතය සටහන් කිරීමට දී ඇති තීරුවේ නිවැරදි කේතය සටහන් තබයි | | | | | |
| 3.4 | (අදළ පරිදි )ඉතිරි ප්‍රස්ථාර දෙක ද සැලකිල්ලට ගනී (වයසට අදාළ දිග/උස, දිගට/උසට අදාළ බර) | | | | | |
| 3.5 | වර්ධන තත්ත්වය නිවැරදිව හඳුනා ගනී (සටහන් 3ම සැලකිල්ලට ගෙන ) | | | | | |
| 3.6 | දරුවාගේ බර/වර්ධන තත්ත්වය මව/ භාරකරු සමඟ සාකච්ඡා කරයි | | | | | |
| 3.7 | පෝෂණ ගැටලු සහිත දරුවන්ගේ බරෙහි අපේක්ෂිත වැඩි වීම සිදු නොවීමට හේතු හඳුනා ගැනීමට තොරතුරු ලබා ගනියි<br>– පැය 24 ආහාර රටාව සහ | | | | | |
| | – අදාළ ඉතිහාසය අනාවරණය කර ගැනීම.<br>උදා: රෝගීව සිටියාද යන්න (වර්ධනය අඩාල වීමකදී හෝ වයසට සරිලන බර අඩු වීමකදී හෝ ) ශාරීරික ක්‍රියාකාරකම් පිළිබඳව (අධිබරට අවදානමක් යැයි සිතෙන විට) | | | | | |
| | – හේතුව නිවැරදිව හඳුනා ගනියි | | | | | |
| | – හඳුනා ගත් ගැටලු ප්‍රමුඛතාගත කරයි | | | | | |
| | – උපදේශනය සඳහා ප්‍රමුඛතම ගැටලු 2-3 ක් හඳුනා ගනියි | | | | | |
| **4** | **උපදේශනය සහ පෝෂණය පිළිබඳ දැනුම ලබා දීම** | **1**<br>දරුවා | **2**<br>දරුවා | **3**<br>දරුවා | **4**<br>දරුවා | **5**<br>දරුවා |
| 4.1 | වර්ධනය සාමාන්‍ය ළමුන්ට වයසට අදාළ පෝෂණ උපදෙස් ලබා දෙයි | | | | | |
| 4.2 | පෝෂණ ගැටලු සහිත ළමයින්ගේ ගැටලු හඳුනා ගෙන නිවැරදි සහ අදාළ පෝෂණ උපදෙස් ලබා දෙයි | | | | | |
| 4.3 | ලබාදුන් උපදෙස් තේරුම් ගත් බව තහවුරු කරයි | | | | | |
| 4.4 | නැවත පැමිණීම පිළිබඳ දැනුවත් කිරීම / අදාළ පරිදි යොමු කිරීම | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4.5 | බර කිරීමට නොපැමිණීම අය B කොටසේ අනුසාරයෙන් සොයා ගනියි | | | | | |
| 4.6 | උපදේශන කුසලතා සතුටුදායකයි (සවන්දීමෙන් ඉගෙන ගැනීමේ කුසලතා සහ විශ්වාසය ගොඩනැංවීමේ කුසලතා ) | | | | | |
| 4.7 | ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථානයේදී කණ්ඩායම් අනුව පෝෂණ අධ්‍යාපනය සිදුකිරීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියට මනා සැලසුමක් ඇත | | | | | |
| 4.8 | බර කිරීමේ මධ්‍යස්ථානයේදී ඒක පුද්ගල උපදේශනය සිදුකරයි | | | | | |
| 4.9 | තෝරාගත් කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් පෝෂණ අධ්‍යාපනය ලබාදෙයි<br>අමතර ආහාර ලබාදීම පිළිබඳ දැනුවත් කිරීමේ සැසි සඳහා දෙමව්පියන්/ භාරකරුවන්ට සහභාගී වීම සඳහා අවස්ථාව ලබා දී ඇත - සමාන්‍ය බර සහිත වැඩි වයස් ළමුන් වයස් කාණ්ඩ අනුව<br><br>(බර කිරන මධ්‍යස්ථානවලට පැමිණෙන දරුවන්ගේ ලක්ෂණවලට අදාළ අවශ්‍යතා අනුව) | | | | | |
| **5** | **අමතර කරුණු** | | | | | |
| 5.1 | බර කිරීමේ මධ්‍යස්ථානය සංවිධානය කර ගැනීමේදී ස්වේච්ඡා සේවකයින්ගේ සහාය ලබා ගනියි | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |